1828

මගේ අංකය:-23/3/5
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
මුතුකණ්ඩිය ව්‍යාපාරය
සියඹලාණ්ඩුව.
2019.04.09

මුතුකණ්ඩිය ව්‍යාපාරයේ සියලුම
ව්‍යාපාර කමිටු සාමාජිකයන් වෙත

17 APR 2019

## ව්‍යාපාර කමිටු රැස්වීම් වාර්තාව - 2019 මාර්තු මාසය.

මුතුකණ්ඩිය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ මාසික ව්‍යාපාර කමිටු රැස්වීම 2019.03.28 දින පෙ.ව.9.30 ට මුතුකණ්ඩිය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේදී පැවැත්විය.

සහභාගී වූ රජයේ නිලධාරින්:-

01. එල්.සරත් පෙම්සිරි සිල්වා - නේවාසික ව්‍යාපාර කළමනාකරු,මුතුකණ්ඩිය
02. එච්.එම්.ඒ. නුවන් ප්‍රසන්න මහතා - තාක්ෂණ සහකාර, වාරි.ඉංජි.කාර්යාලය
03. ඩබ්.එම්.ගුණරත්න මහතා - කෘ.ප.නි.සහකාර,ගොවිජනසේවා මධ්‍යස්ථානය
04. ආර්.එම්.පියරත්න මහතා - සංවර්ධන නිලධාරී,ව්‍යා.කළ.කාර්යාලය
05. කේ.එම්.ඩබ්.උදයකුමාර මහතා - සංවර්ධන නිලධාරී,ව්‍යා.කළ.කාර්යාලය
06. ඩී.එම්.පී.සී.දිසානායක මහතා - සංවර්ධන නිලධාරී, ප්‍රා.ලේ.කාර්යාලය

සහභාගී වූ ගොවිසංවිධාන නියෝජිත වරුන්:-

01. ඩී.පාලිත උඩවත්ත මහතා - සභාපති,ගැමුණු ගො.සං.
02. ඒ.එච්.බන්දුසේන මහතා - ලේකම්,සක්සත් ගො.සං.
03. එම්.පී.පීටර් වීරසිංහ මහතා - භාණ්ඩාගාරික,විජිතපුර ගො.සං.
04. කේ.ඒ.සුමිත් මහතා - ලේකම්,විජිතපුර ගො.සං.
05. ඒ.එල්.විමලපාල මහතා - ගොවි නියෝජිත,සිරිපැරකුම් ගො.සං.
06. ජේ.එම්.එන්.කරුණාතිලක මහතා - ලේකම්,සිරිපැරකුම් ගො.සං.
07. ඊ.සලමන් අප්පුහාමි මහතා - 55 කෙත් ඇල නියෝජිත
08.ඩී.එම්.ගුණසේකර මහතා - සභාපති,රණමයුර ගො.සං.
09.එච්.එම්.ජයරත්න මහතා - ගොවි නියෝජිත,සිරිපැරකුම් ගො.සං.
10.ඩී.එම්.ගාමිණී චන්ද්‍රසිරි මහතා - ගොවි නියෝජිත
11.ආර්.එම්.අබේරත්න මහතා - ගොවි නියෝජිත,සිරිපැරකුම් ගො.සං.
12. කේ.පී.ගාමිණිද සිල්වා මහතා - සභාපති,සිරිපැරකුම් ගො.සං.

පිළිගැනීම හා අරමුණු පැහැදිලි කිරීම :-
ආගම සිහි කිරීමෙන් අනතුරුව පැමිණ සිටි රජයේ නිලධාරින් සහ ගොවිසංවිධාන නිලධාරින් සියලු දෙනා ව්‍යාපාර කළමනාකාර මහතා විසින් පිළි ගන්නා ලදී.

මෙදින රැස්වීමේ අරමුණු පැහැදිලි කරමින් - මෙම රැස්වීම 2019 යල් කන්නය පිළිබඳව සාකච්ඡා කර ගැනීමට පෙර කන්න රැස්වීමක් ලෙස පවත්වන බවත්, 2018 මහ කන්නයේ අස්වනු නෙලීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම, PEISEIP ව්‍යාපෘතියේ JAP වැඩසටහන සංවිධානය කිරීම, දළදා මාළිගාවේ අස්වනු පූජාවට වී කරල් මිටි රැස්කර ගැනීම, ඉදිකිරීම් පුහුණුවට සහභාගී වූ අයගේ අත්දැකීම් විමසීම ප්‍රධාන ලෙස සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බව පවසන ලදී.

අනතුරුව පසුගිය රැස්වීමේ වාර්තාව සභාවට ඉදිරිපත් කළ අතර,එහි සංශෝධන කිසිවක් නොවූ බැවින් සත්‍ය වාර්තාවක් ලෙස එක්සත් ගො.සං.ලේකම් ඒ.එච්.බන්දුසේන මහතා කල යෝජනාව විජිතපුර ගො.සං. භාණ්ඩාගාරික එම්.පී.පීටර් මහතා ස්ථිර කරන ලදී.

| අනු අංක | විෂය ක්ෂේත්‍රය | සාකච්ඡා කල කරුණු/ගනුලැබූ තීරණ | වගකීම |
|---|---|---|---|
| 01 | ආයතන සංවර්ධනය | මාසික මුදල් සාරාංශ මාසය අවසානයේ ව්‍යාපාර කාර්යාලයට ලබා දීමේ කටයුතු පසු විපරම.<br>මාසික කාරක සභා රැස්වීම් පැවැත්වීම -<br>විජිතපුර ගොවිසංවිධානය, ගම්මාන 6 - 2019.03.28<br>එක්සත් ගොවිසංවිධානය, ගම්මාන 5 - 2019.03.29<br>ගැමුණු ගොවිසංවිධානය, ගම්මාන 2 - 2019.04.02<br>මහසභා රැස්වීම් පැවැත්වීම - එකමුතු ගො.සං.2019.04.11<br>රණමයුර ගොවිසංවිධානය,ගම්මාන 3 - 2019.04.07 | ගො.සං. නිලධාරීන්<br><br>සංවර්ධන නිලධාරීන් |
| 02 | අස්වනු නෙලීමේ ප්‍රගතිය | ගම්මාන 3 ගො.සං.සභාපති ඩී.එම්.ගුණසේකර මහතා -<br>50 % වඩා අස්වනු නෙලා අවසන්<br>ගම්මාන 4 ගො.සං.ලේකම් ජේ.එම්.නිමල් කරුණාතිලක මහතා<br>80 % අස්වනු නෙලා අවසන්<br>ගම්මාන 5 ගො.සං.සොලමන් අප්පුහාමි මහතා -<br>85 % අස්වනු නෙලා අවසන්, සමස්ථයක් ලෙස අස්වැන්න අඩු මට්ටමක පවතී.<br>ගම්මාන 6 ගො.සං.භාණ්ඩාගාරික එම්.පී.පීටර් මහතා -<br>90 % අස්වනු නෙලා අවසන්, අස්වැන්න අඩු මට්ටමක පවතී.<br>ගම්මාන 1 සහ 2 – 60 % පමණ අස්වනු නෙලා අවසන් | |
| 03 | පෙර කන්න රැස්වීමේ තීරණ | අදහස් දැක්වීම - තාක්ෂණ සහකාර නුවන් ප්‍රසන්න මහතා -<br>මේ වන විට වැවේ ජල ධාරිතාව අක්.අඩි 9000 ක් පමණ වන අතර, ඉන් අක්.අඩි 7000 ක් පමණ භාවිතා කල හැකිය. එම ජල මට්ටම සැළකිල්ලට ගෙන යල් කන්නය සැළසුම් කරගත යුතු බව පැවසීය.<br><br>ඒ අනුව මානාබරණ වැවෙන් උඩ කොටසට වී වගාව සදහාත්, පහල ගම්මාන 5 – 6 සදහා අතිරේක බෝග සදහාත් ජලය ලබාදීම කලයුතු බවට කමිටුව සාකච්ඡා කර තීරණය කරන ලදී. | |

<u>පෙර කන්න රැස්වීමේ යෝජනා :-</u>

1. ඇලවේල ශුද්ධ කර අවසන් කළයුතු දිනය - 2019.04.12 ට පෙර
2. වගා කරන බෝග වර්ගය - වී මාස 3, 3 ½
   - අතිරේක බෝග, මුං, කව්පි, එලවලු
3. ජලය මුල් වරට නිකුත් කිරීම - 2019 අප්‍රේල් 20
4. වපුරා හෝ පැල සිටුවා අවසන් කළයුතු දිනය - 2019 මැයි 10
5. වී වගා කරන බිම් ප්‍රමාණය - අක්:1360
6. වැවෙන් ජලය නතර කරන දිනය - 2019 අගෝස්තු 15
7. කන්න රැස්වීම පැවැත්වීමට යෝජිත දිනය - 2019 අප්‍රේල් 04

පෙර කන්න තීරණ සම්මත කිරීම -
යෝජනා කලේ - කේ.පී. ගාමිණීද සිල්වා මහතා(සභාපති,සිරිපැරකුම් ගොවිසංවිධානය,ගම්මාන 4)
ස්ථිර කලේ - ඩී.පාලිත උඩවත්ත මහතා(සභාපති,ගැමුණු ගොවිසංවිධානය,ගම්මාන 2)

| අනු අංක | විෂය ක්ෂේත්‍රය | සාකච්ඡා කල කරුණු/ගනුලැබූ තීරණ | වගකීම |
|---|---|---|---|
| 04 | වගා රක්ෂණ ලබා නොදීම | 2018 යල කන්නයේ 5-6 ගම්මාන වල ගොවින්ගේ වගාවන් ජලය නොලැබීම නිසා හානිවූ අතර, ඒ සඳහා කිසිදු වන්දියක් හෝ සහන වැඩ පිළිවෙලක් මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති බව එක්සත් ගොවිසංවිධානයේ හා ඒකාබද්ධ ගොවිසංවිධානයේ ලේකම් ඒ.එච්.බන්දුසේන මහතා ප්‍රකාශ කරන ලදී.<br><br>සංවර්ධන නිලධාරි ප්‍රාදේශීය ලේකම් කාර් යාලය - ප්‍රකාශ කර සිටියේ අප්‍රේල් මාසයේදී මොණරාගල දිස්ත්‍රික්කයේ ගෙවීම් කිරීමට යොමුවිය හැකි බවයි.<br>එහිදී ඒකාබද්ධ ගොවිසංවිධානය තව දුරටත් අදාල ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන බව ලේකම් ඒ.එච්.බන්දුසේන මහතා පැවසීය. | ප්‍රාදේශීය ලේකම් |
| 05 | වැවේ රොන් මඩ ඉවත් කිරීම | මුතුකණ්ඩිය වැවේ රොන්මඩ ඉවත් කිරීමට කටයුතු කරන සමාගම පස් ලෝඩ් 01 සඳහා රු.250/= ක මුදලක් ඒකාබද්ධ ගොවිසංවිධානයට ලබාදීමට එකඟ වී ඇති බවත්, එම මුදල් ඒකාබද්ධ ගොවිසංවිධානයේ ගිණුමට බැර කිරීමට කටයුතු කරන බවත් සභාපති ඩී.පාලිත උඩවත්ත මහතා දන්වා සිටින ලදී.<br>ඒ සඳහා කමිටුවේ අනුමැතිය ඉල්ලූ අතර, එය සුදුසු බව ගම්මාන 3 සභාපති ඩී.එම්.ගුණසේකර මහතා කළ යෝජනාව ගම්මාන 6 භාණ්ඩාගාරික එන්.පී.පීටර් මහතා ස්ථිර කරන ලදී.<br>එම කොන්ත්‍රාත්තුවේදී මානාභරණ වැවේ ද රොන් මඩ ඉවත් කිරීම කරදෙන ලෙසට එන්.පී.පීටර් මහතා කළ යෝජනාව ඒ.එච්.බන්දුසේන මහතා ස්ථිර කරන ලදී. | |
| 06 | පානීය ජල ව්‍යාපෘතියේ ගැටලුව හා හැඩඔය ව්‍යාපෘතිය | දිනකට ඝණ මීටර් 3000 ක් මුතුකණ්ඩිය වැවෙන් පානීය ජල ව්‍යාපෘතියට ලබා ගැනීමට සැළසුම් කර ඇතත්,ගොවියාට වන හානිය වලක්වා ගැනීමට ස්ථිර විකල්ප විසඳුමක් මෙතෙක් ලබාදී නොමැති බව ගම්මාන 3 සභාපති ඩී.එම්.ගුණසේකර මහතා ප්‍රකාශ කරන ලදී.<br>ක්ෂේත්‍ර සහකාර(වාරි:දෙපා:) නුවන් ප්‍රසන්න මහතා ප්‍රකාශ කර සිටියේ හැඩඔයෙන් ජලය වැවට ගෙ ඒම සඳහා මේ වන විට මැණුම් කටයුතු අවසන් කර ඇස්තමේන්තු සකස් කරමින් පවතින බවයි. | වාරිමාර් ග දෙපාර් තමේන්තුව |
| 07 | ස්තූතිය හා නිමාව | නේවාසික ව්‍යාපාර කළමනාකරු ,මුතුකණ්ඩිය -<br>2019 යල වගා කන්න රැස්වීම සාර් ථක කර ගැනීම සඳහා සියලු ගොවින් දැනුවත් කර එදිනට සහභාගී වන ලෙසට ගොවි සංවිධාන වෙත වගකීම පවරන ලදී. අද දින රැස්වීම සාර් ථක කර ගැනීමට පැමිණි සියලු දෙනාට ස්තුතිය ප්‍රකාශ කරමින් රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී. | |

මී ලඟ ව්‍යාපාර කමිටු රැස්වීම - 2019.04.23 දින පෙ.ව. 9.00 ට ව්‍යාපාර කළමනාකරණ කාර් යාලයේ දී.

එල්.සරත් පෙම්සිරි සිල්වා
නේවාසික ව්‍යාපාර කළමනාකරු
මුතුකණ්ඩිය ව්‍යාපාරය.

එල්. සරත් පෙම්සිරි සිල්වා
නේවාසික ව්‍යාපාර කළමණාකරු
මුතුකණ්ඩිය ව්‍යාපාරය
සියඹලාණ්ඩුව.